# කැනඩාවේ ඔටාවාහිදී "පේරාදෙණි සරසවි ආදී සිසු සමුළුවේ" දෙවන වාර්ශික මහා සමුළුවාරයේදී, ගරු ලේකම් පැවැත්වූ ස්තුති කථාව (පෙබරවාරි 22, 2014)[1]

1 සංගේ හිතවතානෙනි මුලසුන ඉන්න
නෝනවරුනි මහතුනි සරසවි උන්න
හන්තානයට ලැදි සැමටම අහගන්න
තුති පුද දෙන්න මදකට මට ඉඩ දෙන්න

2 කෙටි කලකදි උනත් හොඳ ගමනක් ආවා
රත්නායක නිමල් මග සලකුනු කීවා
මල් විතරක් නෙවෙයි ඉඳ හිට ගල් ආවා
ගරු සේවයට පෙර කොමිටියෙ තුති වේවා

3 නව ගමනක් මෙතැන් සිට අද අරඹන්න
සංගේ පැමිණ ඇත සුක්කානම ගන්න
හැමටම බැරි නිසා පොදු වැඩ කර දෙන්න
නව කොමිටියට මේ තුති පුද පිළි ගන්න

4 නීතිය විනය දෙක ගැන නිති තිබෙයි ඇහෑ
හරියට වැඩ බෙද දෙයි බොරු කරනු බැහැ
කොමිටිය රැස් උනෙත් වැඩිපුර ඔහුගෙ දිහෑ
මුළසුන සිටි නිමල් හට තුති නොකර බැහැ

5 පොඩ්ඩ සිටම මා හොඳ හැටියට දන්නා
දුටු මුල් දිනේ කොට ජංගිය ඇඳ උන්නා
දීපානන්ද හේරත් රටතොට දන්නා
මෙහෙයුව චාරිකාවට තුති පුද දෙන්නා

---

1 මෙම කවිපෙල හෙලයෙන් යතුරු ලියා සකසා දුන් නෙපියන විවාද මාවත නිවැසි කිත් විරසුරු මිතුරාට කතුවරයාගේ හදබැති තුතිය.

6 නිහඬව නිස්සංක ඉහළයි කල සේවේ
සමරේ සමන් නැහැ කිසිතැන පසු බෑවේ
කාන්තිත් ඇවැසි හැමතැන පෙරටයි ආවේ
ඒකයි මේ හැමට තුති පුද හිමිවූවේ

7 අන් අය සිතන දෙය ගැන නිති විමසනවා
හිත් රිදුමක් වේද? හරියට බයවෙනවා
ධර්මෙන් සුධර්මා නිසිමග ගෙනියනවා
පොත් දුන් සමරජීවට තුති පුද දෙනවා

8 නිමලුයි ලක්ෂ්මනුයි සංගීතය දන්නා
රංජිත් නයන හා උදයද මෙහි ගෙන්නා
ලංකා සුමුදු සමගින් තාලය පෙන්නා
කළ සේවයට මම දැන් තුති පුද දෙන්නා

9 හන්තානෙන් ලැබුන එඩිතර ගතිය මැද
පරිසර රකින රැකියාවක් කරන හොඳ
ළමුනට රංගනය පුහුණුව දෙවන ලද
රේනුට තුති පුදමි පිරි සෙනෙහසින් හද

10 මේ සමුලුවට සාමාජිකයෙක් දුන්න
මුලසිට මෙතෙක් අප පිටි පස්සෙන් උන්න
පෙරදිග අපරදිග බස වැහැරුම දන්න
අල්විස් රාජේන්ද්‍රට තුති පුද මෙන්න

11 සියලුම අනුග්‍රාහකයින් වැඦබේවා
රැඟුමට ළමුන් දුන් මව්පිය සැරදේවා
එලෙසම ඒ ළමුන්ටත් තුති පුද වේවා
අප සංගමය ඔබ නිරතුරු ජයවේවා

12 මිනිසෙකු නොවෙයි ඔහු ගොඩසිට පදින ඔරු
ප්‍රායෝගික නිසා සැමතැන ගසති තරු
මේ සංගමයෙ සතයට ගනුදෙනුව කෙරූ
රත්නට ප්‍රේම් මම නිරතුරු කරමි ගරූ

13 අය වැය ලේඛනය විමසුම ඇසට ගෙන
නීතිය කැඩී ඇද්දයි ඇති වැරදි වන
නොමිලේ බලාදී පිරිසුම් සහය වුන
පියසිරි මහින්දට තුති හැර දෙයද මොන

14 ඇඟපත සරුයි මොළයෙන් කවදත් විරුව
බෙල් කොම්පැනියෙ දිගටම නිලතල දැරුව
අදිමදි කරන බර වැඩ ටික ඉටු කෙරුව
රොෂාන් රාජපක්ෂට මේ තුති තරුව

15 අප සංගමයේ - අන්තර්ජාලය - විදුලි තැපෑලද ගොඩ නැගුවා
මුද්‍රණ වැඩවල - මුල්තැන් ගනිමින් - සංස්කරණ පදනම හැදුවා
කාටත් කලියෙන් - පවරන වැඩටික නිසිලෙස නිසිකල නිම කෙරුවා
දීපානී කළු - සේවය සුළුපටු - නැහැ තුති පුද නොමකර බැරැවා

16 ඔහු දැන් නිහඬයි - තොරතුරු විමසයි - ඇහුවොත් අතදෙයි නැතිව නිමා
ඇයගෙන් සිදුවෙයි - ලියාපදිංචිය ගේදොර - වැඩපල ඉවත දමා
ඔහු, ඇය දෙන්නා - ඔබ අප දන්නා - සුසන්ත දයානි යුවල තමා
කලයුතුකම් ගැන ස්තුතිවේවා! මොහොට්ටාලලා නොමැත පමා

17 හිල්ඩා පන්සල - මොනිකා පල්ලිය හන්තානේ සාදය හින්ද
ඉඩකඩ දුන්නා - අඩු බඩු දුන්නා මේ කාගෙත් හොඳහිත රන්ද
ලක්ෂමන් ගලගෙදරත් - මෙහි නැතිමුත් - මේ බැනරය මෙහිදුන් සන්ද
තුති පුද කරනෙමි - නොඅඩුව අද දින සැම වෙනුවෙන් හොඳ හිත බන්ද

18 එක්සත් පල්ලිය මේ අප ඉන්නා එහි වැඩ කරනා සියලු දෙනා
හරිනී, උදුලා, අරුනී, ඉන්දුත්, කීර්ති නිරතුරු සහය වුනා
සමන්-ඉරංගී, අරුන-වසන්තා, මාර්ටින්-කුමුදිනි හැඩය ගෙනා
කල හැම දේටම හරි ස්තූතියි! කිසි අඩුවක් නැහැ සවිය මනා

19 මුහුදක් නැති තැන වැවක තියෙන වැලි තලාවකට ගමණක් යෙදුනා
එගමන සැමගෙන රිය පදවන්නට විහාන් සෙනෙවිරත්නට යෙදුනා
ඉතා සූක්ෂම විනයක් ඇති - රියදුරෙකු ලෙසින් වැඩටික කෙරුනා
අද මෙහි නැතිමුත් ඒගැන ඔහුටත් මගෙ තුති මේ ලෙස පුද කරනා

20 ඔබගේ මුදලින් පුදකල ශිෂ්‍යත්වයන් දහතර හන්තානේ
සරසවියෙදි මෙහෙයුම් කරදුන්නේ මව් සංගමයයි සැක නෑනේ
මේ හැම එක්වී සැපයූ පොත්පෙල පුස්තකාලවෙත දුන් දනේ
සම්බන්දීකරණය කල අයිරාටත් තුති දෙමි පුරවා හද සන්තානේ

21 අප සරසවියේ නාදන් සාල-වේ සිටිනා සිසුකැලට සද
ඔබ අප එක්කල ඒ අගනා අරමුදල් කලමනා කෙරුව මෙද
පරිගනකද මොනිටර හතරද අඩුමුදලට ලැබදුන් නුවන යොද
ගාමිණි සිල්වාහට තුති නොකලොත් එය අඩුවක් වෙයි අපට මෙද

22 ගියත් ලොව දස අත - තිබේ සංගමයට හිත
ඔබව අමතක නැත - සම්පතුත් දුන් සහය පොඩි නැත

23 නයනා සමගින් මනෝජ්ද සිල්වා
දුන් සහයෝගය අතහිත සොල්වා
නැහැ අමතක වී සුවඳ අතුල්වා
බැතියෙන් තුති පුදදෙමි නෙතු දල්වා

24 ඔටාවාවල පොදුවැඩවල කවදත් කොතැනත් පෙරමග අරගත්තු
ඩොනල්ඩ් අසෝකල, බෝල්ඩ් චමින්දල, ඕලින්ස් අමරල හිතවත්තු
එරටත් මෙරටත් පතලයි මේ අය කොමිටිය ඉහලින් පිලිගත්තු
අයමයි, තුතිදෙමි හන්තානයෙ ගුරුකුලය නමින් හද බැඳගත්තු

25 වියපෘතිද වැඩසටහන් මැද සාදයන් අතර දයක වූවේ
මේ ඔබ සැමමයි කිසි අඩුවක් නැහැ ලෝබ නැතුව අතහිත පෑවේ
පනහට වැඩි අප සාමාජික කැල නැතිනම් බැහැ මේ කල සේවේ
එබැවින් ඔබ සැමදෙනාට හිමිවෙයි අඩුනැතිවම තුති පුද රාවේ

26 සාමාජික නොසාමාජික පිරිවරට
සහ ඒ සැම පවුල් සමුළුවෙ දියුනුවට
කළදේ අපමණයි මතකයි කොමිටියට
නම කී නොහැකිමුත් තුති! හැම කෙනෙකුහට

*** ගෙදර යා යුතුවේ - ඒ හඬට මා නතුවේ ***
*** බලය ඇය සතුවේ - ඒ නිසා මෙය කිවිය යුතුවේ ***

27 වරදින සියලු තැන හද සෙනෙහස පෙන්නා
නැති හැමතැනම මගෙ හොඳනම රැක දුන්නා
පොදු වැඩවලදි මා වෙනුවෙන් බරගන්නා
මගෙ බිරිඳටත් තුති පුද දෙමි පෙම පෙන්නා

*** වැඩි කවි අසාරය - රෑ කල බයංකාරය ***
*** තුති පුද හමාරය - නිමයි මෙතනින් සමුළුවාරය ***

********